තවලම ප්‍රාදේශීය සභාව
ගාල්ල දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට තවලම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොලී රු.25,830 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) නිලධාරීන් වෙත ලබා දී තිබූ රු.14,255 ක වටිනාකම වූ ගණක යන්ත්‍ර 16 ක් කාර්යාල උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.1,970,647 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**1.3.4 අවිනිශ්චිත ගිණුම්**

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.18,428 ක අවිනිශ්චිත ගිණුම් හර ශේෂය හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.23,156,587 ක ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.379,708 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 2,464,624 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

----------------------

**2.2.1 අක්කර බදු**

------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාලව සභාව විසින් අයකර ගත යුතුව තිබූ රු.72,555 ක අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු. 468,420 ක උසාවි දඩ හා රු. 1,580,940 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**2.2.3 කඩ කාමර බදු**

----------------

බටහේන දෙමහල් වෙළඳපොල සංකීර්ණයේ කඩ කාමර 13 පිළිබඳව සිදුකරන ලද විගණන පරික්ෂාවේදි පහත කරුණු නිරීක්ෂණය විය.

(i) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක : දපපා / පපාකො / 2010/1 දරන චක්‍රලේඛයෙහි 5 වන ඡේදය අනුව සෑම ගිවිසුමක් ම වසර තුනකට වරක් යාවත්කාලීන කළයුතු බව දක්වා ඇතත්, විගණන දින වූ 2014 මාර්තු 10 දින වනවිට සභාවට අයත් කඩ කාමර 12 ක් බදු ගිවිසුම් නොමැතිව පවත්වාගෙන යමින් පැවතුණි.

(ii) ඉහත චක්‍රලේඛයේ 6 වන ඡේදය අනුව යටත් පිරිසෙයින් වසර 05 කට වරක් තක්සේරු කළ යුතුය යන්න දක්වා තිබුණ ද, සියලුම කඩ කාමරවලින් වසර 09 කට

වඩා පැරණි තක්සේරු මුදලකට අනුව තීරණය කළ බදු මුදලක් අය කර ඇති බව නිරීක්ෂණය විය.

(iii) බදු ගිවිසුමේ 19 වන කොන්දේසිය අනුව නියමිත දිනට බදුකුලී ගෙවීම අඛණ්ඩව මාස තුනක් පැහැර හැරියහොත් දේපලෙහි සන්තකය ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව ක්‍රියා කරමින් ආපසු ලබා ගැනීමේ සම්පූර්ණ අයිතිය සභාවට තිබෙන බව දක්වා තිබුණ ද, මාස 06 කට වැඩි බදු නොගෙවූ කඩ කාමර 04 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(iv) බදුකරු විසින් එකී කඩ කාමරයේ හෝ එහි යම් කොටසක බුක්තිය වෙනත් අයෙකුට අතුරු බදුදීම නොකළ යුතුය යනුවෙන් ගිවිසුමේ දක්වා තිබුණ ද, පළමු මහලේ කඩ කාමර 03 ක් අතුරු බදු දී තිබුණි.

(v) සභාවේ ලිඛිත අනුමැතියකින් තොරව මෙම කඩ කාමරවල කිසිදු වෙනස් කිරීමක් හෝ අළුතින් කොටස් එකතු කිරීමක් නව ඉදිකිරීමක් හෝ කිසියම් වෙනස් කිරීමක් ප්‍රාදේශීය සභාවේ පූර්ව අනුමැතියකින් තොරව සිදුකල නොහැකි බව ගිවිසුමේ දක්වා තිබුණ ද, කඩ කාමර 02 ක වෙනස්කම් කර තිබුණි.

(vi) කුමන හෝ කොන්දේසියක් කඩ කළහොත් ඒ බැව් දැන්වීමෙන් පසු ලිත් මාසයක දැනුම් දීමෙන් කඩ කාමරය සභාවට පවරා ගැනීමට සම්පූර්ණ බලය ඇත යන්න ගිවිසුමෙහි දක්වා තිබුණ ද, කොන්දේසි කඩකල බදුකරුවන් කිසිවකු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(vii) වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 08 කින් විගණන දිනය වූ 2014 මාර්තු 11 වනවිට එක්වන් මුදල් රු.540,000 ක් සභාවට අයවීමට තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව සභාපති, උප සභාපති ඇතුළු සියළුම සභිකයින් විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දියයුතු වුවද, සභාවේ සභාපති, උප සභාපති හා මන්ත්‍රීවරුන් 07 දෙනෙකු විසින් 2011, 2012 හා 2013 වර්ෂ සඳහා විගණන දින වූ 2014 මාර්තු 07 දින වන විටත් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සභික දීමනා ගෙවීම**

----------------------

2005 ඔක්තෝබර් 05 දිනැති අංක : 1413/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙන්, ප්‍රාදේශීය සභාවක සභාපති, උප සභාපති හා සභිකයින්ට සභික දීමනා ගෙවීමේදී වෛද්‍ය හේතුන් මත හා සභාවේ අනුමැතිය ඇතිව නිවාඩු ලබා සිටින විට හැර අදාළ මාසයෙහි පවත්වන ලද සභා රැස්වීම් සහ කාරක සභාවට සහභාගී නොතිබුණහොත් දීමනා ගෙවිය නොහැකි බව දක්වා තිබුණ ද, එකී නියමයන්ට පටහැනිව 2013 වර්ෂය තුළ සභිකයින් 05 දෙනෙකු වෙත රු.46,500 ක් ගෙවීම් කර තිබුණි.

**(ආ) සේවක ණය**

--------------

මාරු වී ගිය, විශ්‍රාම ගිය සහ සේවය අතහැර ගිය සේවකයින් 11 දෙනෙකුගෙන් අයකර ගතයුතු රු.187,509 ක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 නිශ්ක්‍රීය වත්කම්**

--------------------

සභාව සතු රු.1,944,050 ක් වූ වාහන දෙකක් සහ රු.185,000 ක් වූ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය වර්ෂ 02 සිට 04 දක්වා කාලයක් නිශ්ක්‍රීයව පැවති බව 2014 මාර්තු 11 දින සිදුකල විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

**4. පද්ධති හා පාලනය**

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) **අයවැය පාලනය**

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය